# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

කෘතියේ නම - මිතුදම

කතෘගේ නම - නදේවිමා දම්සරණි

කෘතිය පළ කරන දින - 2025.01.28

ISBN අංකය

එකමත් එක කාලෙක සීතල පුංචි ගමක මලී කියල ලස්සන ගැහැණු ළමයෙක් හිටියා.

මලී හරි ආසයි අම්මත් එක්ක එකතුවෙලා මල් පැළ හිටවන්න.



එය දවසක් ලස්සන මල් පැළයක් හිටෙව්වා.

එයා දවසක් වත්තට යනකොට මල් පැලේ නැහැ අනේ මගේ මල් පැළ කවුදෝ කෙනෙක් කාලා කවුද මගේ මල් පැළ කෑවේ......... අනේ කවුද කියන්න කෝ ඊ .......?........ හ් ..........හ් ........ කියලා අඬන්න පටන් ගත්තා.



චූටි හොරෙක් වගේ පදුරක් අස්සේ හැංගිලා හිටපු දළඹු පැටියෙක් හඬ අවදි කලේ ය.

“අනේ, මට හොඳටම මඩගිනි මං ඔයාගේ කියලා දන්නේ නෑ. මං ඒක කෑවා ” දළඹු පැටියා ඇත්තම පැවසුවේය.




කමක් නෑ. මං ඔයත් එක්ක තරහ නෑ මලී කිව්වා අපි දෙන්නා හොඳම යාළුවෝ වෙමු. දළඹු පැංචා කිව්වේ. මං කැමතියි.

මම අද මෙහෙම කැත දළඹුවෙක් වෙලා හිටියට "බලන්නකෝ දවසක මම ඔයාගේ මල් වත්තට එන හැටි"

මලී, නිහඬව බලාගෙන හිටියා. දළඹුවා කියපු දේ එදා මලිට තේරුනේ නෑ

තවත් එක් දවසක් උදෑසන මලී වත්තේ මල් පැළ සිටිවමින් සිටියා. එදා දළඹුව පේන්න හිටියේ නෑ. එයා හැම තැනම දළඹු යාළුවා හෙව්වා. ඒත් එයා පෙන්න නැති හින්දා දුක සිතුනා.



ඔහොම කාලයක් ගෙවිලා ගියා. එක දවසක් ලස්සන උදෑසන ඉර පායලා මුතු ඇට වාගේ පිනි බිඳු බබළමින් තිබුණා.

මල්ලිගේ මල් ගහේ ලස්සන මල් පිපිලා එයා සතුටින් ඒවා දිහා බලාගෙන හිටියා.

එත් හිතේ පුංචි දුකක් තිබුණා "දළඹු යාළුවා නැහැනේ "

"මම අම්මට කිව්වා දළඹු යාලුවා නැතිව" "මට පාළුයි කියලා"

"අම්මා කියනවා දළඹුවා හිටියනම් ඒක මල් ගහක්වත් නෑ ඔක්කොම කනවනේ"

එත් මල් ගහට වැඩිය යාළුකම වටිනවා මගේ හිතට පුංචි දුකක් ඇවිල්ල හීනයට ඇහැ ළඟින් කඳුළු බිංදු දෙකක් වැටුණා.



මෙන්න ටිකක් වෙලා යනකොට ලස්සන සමනැල්ලෙක් ආවා.

"ඔයා මාව අඳුරෙනවද සමනැලිය මගෙන් ඇහුවා"

"නැහැ"

"අර ඔයාගේ මල් ගහ කාපු දළඹුව තමයි මම"

ඈ............... ඈ............... ඈ...............

මලී පුදුමයට පත්වුණා

"ඔයා දැන් හරි ලස්සනයි නේ............"



“එදා මං බඩගින්නට ඔයාගේ මල් ගහ කෑව තමයි.”

“අද මම සමනලයෙක් වෙලා ඔයා ළඟට ආවා”

“ඇත්තටම හරිම සතුටුයි” මලි කිව්වා.

“හොඳ යාලුවෝ කවදාවත් ජීවිතේ දුෂ්කර කාල වලදී දාල යන්නේ නෑ අපි හැමදාම හොඳ යාළුවෝවෙලා ඉමු.”



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්